මයිනා රක්ෂණ සහතිකය නොමැති අය සඳහා

# සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනයක් ඔබ වෙත එවනු ලැබේ

ඔබගේ වත්මන් සෞඛ්‍ය රක්ෂණ සහතිකය 2025 දෙසැම්බර් 2 වන දින සිට භාවිතා කල නොහැකි වේ. මයිනා රක්ෂණ සහතිකයක් ඇති අය, එය භාවිතා කර වෛද්‍ය ආයතන ආදියේ දී වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටිය හැක. **නමුත්, මයිනා රක්ෂණ සහතිකයක් නොමැති අය වෛද්‍ය ආයතන ආදියෙන් වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටින විට, සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය අවශ්‍ය වේ.**

*මයිනා රක්ෂණ සහතිකය ... මයි නම්බර් කාඩ්පත මගින් රක්ෂණ සහතිකය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි කල දෙයකි

## සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය යනු කුමක් ද?*

* 資格確認書 (shikaku kakunin-sho)

මයිනා රක්ෂණ සහතිකය නොමැති අවස්ථාවක*, සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය වෛද්‍ය ආයතන ආදිය වෙත ඉදිරිපත් කිරීමෙන්, සුපුරුදු පරිදි රක්ෂණ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැකිය.

*ඔබට මයිනා රක්ෂණ සහතිකයක් නොමැති අවස්ථා ලෙස සැලකෙන්නේ පහත සඳහන් අවස්ථාවන්ය.
- මයි නම්බර් කාඩ්පතක් නොමැත, එසේත් නැතහොත් මයි නම්බර් කාඩ්පත සෞඛ්‍ය රක්ෂණ සංගමයට ඉදිරිපත් කර නොමැත
- සෞඛ්‍ය රක්ෂණ සහතිකයේ භාවිතය ලියාපදිංචි කර නොමැති වීම ආදී කරුණු හේතු කොට ගෙන, මයි නම්බර් කාඩ්පත භාවිතා කොට වෛද්‍ය ආයතන ආදියේ දී වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටීමට නොහැක
- මයි නම්බර් කාඩ්පතේ ඇති විද්‍යුත් සහතිකය කල් ඉකුත් වී ඇත

## අදාළ පුද්ගලයින්

දැනට සෞඛ්‍ය රක්ෂණ සහතිකයක් ඇති අය (2024 නොවැම්බර් 30 දක්වා ඇතුලත් වූ අය) අතුරින්, 2025 අප්‍රේල් 30 වන විට මයිනා රක්ෂණ සහතිකයක් නොමැති ග්‍රාහකයින්

### Q පවුලේ සියලුම සාමාජිකයින් සඳහා වන සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය ඔබ සතුව නොමැත්තේ මන්ද?

මයිනා රක්ෂණ සහතිකයක් නොමැති ග්‍රාහකයින් හට සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය යවනු ලැබේ. තවද, සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛන 5ක් හෝ ඊට වැඩි ගණනක් ඇති විට, ඒවා ලියුම් කවර කිහිපයක බහා එවනු ලැබේ.

### Q දැනටමත් සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනයක් තිබෙන නමුත් අලුත් ලේඛනයක් ලැබුණා. පාවිච්චි කරන්න ඕනෙ මොන ලේඛනය ද?

කරුණාකර ඔබගේ සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනවල ඉහළ දකුණු කෙළවරේ ඇති නිකුත් කළ දිනය පරීක්ෂා කර, නව දිනය සහිත ලේඛනය භාවිතා කරන්න. තවද, කරුණාකර මේ සමඟ අමුණා ඇති පිළිතුරු ලියුම් කවරය භාවිතා කර, පැරණි දිනය සහිත ලේඛනය නැවත එවන්න.




### Q දැනට තිබෙන සෞඛ්‍ය රක්ෂණ සහතිකයට කළ යුත්තේ කුමක් ද?

සෞඛ්‍ය රක්ෂණ සහතිකය 2025 දෙසැම්බර් 1 වන දින දක්වා භාවිතා කළ හැකි නමුත්, 2025 දෙසැම්බර් 2 වන දින සහ ඉන් පසු එය තවදුරටත් සෞඛ්‍ය රක්ෂණ සහතිකයක් ලෙස භාවිතා කළ නොහැකි වන බැවින්, කරුණාකර ඔබම එය බැහැර කරන්න. එසේම, 2025 දෙසැම්බර් 1ට පෙර විශ්‍රාම යාම ආදී හේතුවෙන්, අප සංගමයේ සෞඛ්‍ය රක්ෂණය පවත්වාගෙන යාම සඳහා වන ඔබේ සුදුසුකම අහිමි වුව හොත්, කරුණාකර කාඩ්පත ව්‍යාපාර ස්ථානයට නැවත ලබාදෙන්න. (ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යන ග්‍රාහකයෙකු විසින් රැකියාවක් ආදියෙහි නිරත වීම මත ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යාම සඳහා වන සුදුසුකම අහිමි වුව හොත්, කරුණාකර “ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යන රක්ෂිත පුද්ගලයාගේ සුදුසුකම් අවලංගු කිරීම සඳහා වන අයදුම්පත”* සමඟ සංගමයට නැවත ලබාදෙන්න.

* 任意継続被保険者資格喪失申出書 (nin'i keizoku hihokensha shikaku sōshitsu mōshidesho)

සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය ඔබට ලැබෙන අවස්ථාවේ දී ඔබ අප සංගමයේ ග්‍රාහකයෙකු නොවේ නම්, කරුණාකර මේ සමඟ අමුණා ඇති පිළිතුරු ලියුම් කවරය භාවිතා කර සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය නැවත එවන්න.
*ඔබ විසින් එවන සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය භාවිතා කළ නොහැකි බැවින්, **වහාම එය බැහැර** කරනු ලැබේ.
**කරුණාකර, සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛනය නැවත යැවීම හැර වෙනත් අරමුණු සඳහා මේ සමඟ අමුණා ඇති පිළිතුරු ලියුම් කවරය භාවිතා නොකරන්න.**

විදේශීය භාෂාවලින් මෙම පත්‍රිකාව ලබාගැනීම මෙතැනින්

# වෛද්‍ය ආයතන ආදියේ දී වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටීම, මයිනා රක්ෂණ සහතිකය මගින්



*මයිනා රක්ෂණ සහතිකය ...... මයි නම්බර් කාඩ්පත මගින් රක්ෂණ සහතිකය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි කල දෙයකි

## 1 වන ප්‍රයෝජනය වෛද්‍ය තොරතුරු බෙදා ගැනීම මගින් උසස් තත්ත්වයේ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැකිය!!

මයිනා රක්ෂණ සහතිකය භාවිතා කර වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටින්නේ නම්, ඔබ පළමු වරට යන වෛද්‍ය ආයතනයක දී වුව ද විශේෂිත වූ සෞඛ්‍ය පරීක්ෂාවන්, ඖෂධ හෝ ප්‍රතිකාරවල තොරතුරු වෛද්‍යවරයා ආදියට බලා ගැනීමට හැකි වී, වඩාත් සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැකිය. (සහතිකයේ හිමිකරු එකඟ වන්නේ නම් පමණි).

### සාම්ප්‍රදායික රක්ෂණ සහතිකය ඇති විට




### මයිනා රක්ෂණ සහතිකය තිබේ නම්




## 2 වන ප්‍රයෝජනය කවුන්ටරයේ දී මිල අධික ගාස්තු ගෙවීම, කිසිදු ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකරම අනවශ්‍ය වී යයි!!

ඔබ මයිනා රක්ෂණ සහතිකය භාවිතා කර වෛද්‍ය පරීක්ෂාවකට පෙනී සිටිය හොත්, උපරිම වියදම් සීමාව අදාළ කෙරෙන සුදුසුකම් සහතිකය ඔබට නොමැති වුව ද, ඔබේ ගෙවීමේ සීමාව ඉක්මවන වෛද්‍ය වියදම්, ඔබ විසින් අත්තිකාරමක් ලෙස තාවකාලිකව ගෙවීමට අවශ්‍ය නොවේ.

### සාම්ප්‍රදායික රක්ෂණ සහතිකය ඇති විට




* 限度額適用認定証 (gendogaku tekiyō nintei-shō)

### මයිනා රක්ෂණ සහතිකය තිබේ නම්




## ක්‍රියා පටිපාටිය පහසුයි! රක්ෂණ සහතිකය ලෙස මයි නම්බර් කාඩ්පත භාවිතා කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි කවරේ ද?

රක්ෂණ සහතිකය ලෙස මයි නම්බර් කාඩ්පත භාවිතා කල හැකි වීම සඳහා, "රක්ෂණ සහතිකය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි කිරීම" ඔබ විසින්ම කල යුතු වේ.
භාවිතා කිරීමේ සැලසුමක් නොමැති වුව ද, කරුණාකර හැකි ඉක්මනින් ලියාපදිංචි වන්න.

### • රක්ෂණ සහතිකය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි කිරීම මෙතන දී සිදු කල හැකිය •




මයිනා පෝටලය




වෛද්‍ය ආයතන ආදියේ කවුන්ටරයේ ඇති කාඩ්පත් කියවනය




සෙවන් බැංකු ATM එක

මයිනා පෝටලය මගින් "වෛද්‍ය වියදම් තොරතුරු" සහ "මගේ සුදුසුකම් තොරතුරු" පරීක්ෂා කළ හැක. බදු වාර්තා කිරීම සඳහා ද එය භාවිතා කළ හැකිය.

කරුණාකර මයි නම්බර් කාඩ්පත මගින්, රක්ෂණ සහතිකය භාවිතා කිරීමට අයදුම් කිරීම පිළිබඳ විස්තර 2D කේතය වෙතින් පරීක්ෂා කර ගන්න.
සෞඛ්‍ය, කම්කරු සහ සුබසාධන අමාත්‍යාංශය විසින් නිර්මාණය කරන ලද වීඩියෝව
▶ [අයදුම් කරන්නේ කෙසේ ද? මේ දැන් එය කළ හැකියි! පහසුවෙන් අයදුම් කිරීමේ අනුවාදය]

**මයිනා පෝටලය (දකුණු පස ඇති 2D කේතය) මගින්, මයි නම්බර් කාඩ්පතෙහි සෞඛ්‍ය රක්ෂණ සහතිකය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි වීමේ තත්වය පරීක්ෂා කරගත හැකිය.**

මයිනා පෝටලය